

# සංක්‍රමණිකයකුගේ සටහන

## පවන

මෙල්බන් පුරවරයේ ඇති විද්‍යුත් මාධ්‍ය ජාලයට ශ්‍රී ලංකාවෙන් එකතු වෙන අළුත්ම මාධ්‍ය සගයා පවන යි. ජනතාවට තොරතුරු දැන ගැනීමට කොපමණ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තිබුණත්, ඒ අතරට තවත් අලුත් මාධ්‍ය ආයතන එකතුවීමේ යටි අරුත නම් පවතින මාධ්‍ය ක්ෂේත්‍රයෙහි යම් අඩුවක් හිස් තැනක් ඇති බවයි. ඒ අඩුව පිරවීමේ තිරසාර අදිටනින් ශ්‍රී ලාංකික අප අතරට එන නැවුම් ගුවන් විදුලි සාර සංග්‍රහය වන පවන මෙල්බන්වාසී සිංහල ජනතාවට රුදුරු චන්ඩ මාරුතයක් නොවී සොඳුරු මද පවනක්ම වී සැමගේ සිත් සතන් ආනන්දයෙන් ප්‍රඟාවට ගෙන යෑමට හැකි වේවායි පතනවා.

## සෝප් ඔපෙරා

අඩුව තිබුනේ මෙපමණයි. හිතවතුනි, අළුත් වසංගතයක් දැන් මෙල්බන් පුරා පැතිර යමින් තිබෙනවා. ලංකාව තුළ පතල වූ සබන් දැන්වීම සඳහා තරුණියන් රවටා චිත්‍රපට ගතකල නිරුවත් ජවනිකා රැගත් ඩීක්‍ෂ තැටියෙන් පටන් ගත් මේ ශ්‍රී ලාංකික ලඳුන්ගේ ලිංගික ජවනිකා රැගත් ඩීක්‍ෂ තැටි දැන් එක දිගටම පැමිණෙමින් පවතිනවා. ආරම්භය නීතාගේ අත්දැකීම් ඉන්පසු මනෝරියාගේ දිනපොත, දැන් ෂෙරීන්. තව ටික කලකින් ඩිංගිරි මැණිකේත් සුමනාවතිත් එයි. මේක ව්‍යසනයක්. ස්වභාවයෙන්ම මිනිසා තුළ ඇති අනෙකුන්ගේ ලිංගික ක්‍රියාකාරකම් පිළිබඳ ගුප්ත කුතුහලය දඩමීමා කරගෙන ලංකාවේ ජඩ වෙළඳුන් අහිංසක තරුණියන් විදේශිකයන් හා යොදමින් කරන මේ ගුජුප්සාජනක ව්‍යාපාරය අපිට අනියමින් පවසන්නේ අප අගය කළ අපේ සාරධර්ම හා සංස්කෘතික හික්මීම්වල අවසන් පුරුකත් ඉන් ගැලවී ඇති බවද? මේ වෙනුවෙන් අපට කල හැක්කේ කුමක්ද? සීඝ්‍රයෙන් ජරා ජීර්න වෙමින් පවතින අපේ සමාජ හර පද්ධතීන් ආරක්‍ෂා කර ගැනීමට මඟක් ගැන මදක් හෝ කල්පනා කරන්න මහත්වරුනි.

## අසන්නෝ සහ කසන්නෝ

පසුගිය දිනවල ප්‍රචාරය වුණ රේඩියෝ ටෝක් බැක් වැඩ සටහන් දෙක ගැන හැම තැනම කතාව ගියා. ඒ නිසාම ඒ ගැන ලියන්න හිතුණා. මා මේ ලියන්න යන දේ මේ වන විට ඔබට හොඳින් වැටහිලා ඇති. අසන්නන්ගේ ස්වාධීන අදහස් ප්‍රකාශණයි අසන්නන් ලවා කරවාගනු ලබන ප්‍රකාශණයි අතර වෙනස. පොදු ව්‍යවහාරයේ දී අපි මෙවැනි දේ හඳුන්වන්නෙ පිටකසා ගැනීම් හැටියට. තමන් කරන දේ ගැන විශ්වාසයන් නොමැතිව තමන්ගේ පැවැත්ම රැකගැනීමට කළ මේ බොරුව පිළිකුල් සහගතයි. ඒ එක්කම අපේ හමුදා සෙබලුන් වෙනුවෙන් සකස් කර ඇති හැඟීම්බර ප්‍රචාරක දැන්වීම තමන්ගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා කූට ලෙස යොදූ ගැනීම ගැන බලවත් විරෝධය ප්‍රකාශ කරනවා. මේ වගේ පහත් වැඩ මේ මෙල්බන් ඉතිහාසයේ කවදාවත් වෙලා නැහැ.

## නිලවරණය

නිලවරණ මැතිවරණ ජනතාවට වැදගත් උනේ බොහෝම ඉස්සර. මිනිස්සු දැන් ඒව ගැන තකන්නේ නැහැ. එච්චර කවුරු කලත් ප්‍රතිඵලය එක බවට හැමෝම පූර්ව නිගමනයට එළඹිලා ඉන්නේ. ඒත් මැතිවරණයකදී ඇති බලය රැකගන්න හා නැති බලය ලබා ගන්න හදන කට්ටියට නම් ඒක හරි වැදගත්. ඒක ලංකාවට විතරක් නොවේ මෙල්බන්වලටත් පොදුයි. මෙවර සිංහල රේඩියෝව සඳහා පැවැත්වෙන නිලවරණයේදී බලය උරගා බැලීම සඳහා පිටපොට ගසමින් සුදානම් වෙන කණ්ඩායම් දෙස බලද්දී ඇති වෙන්නේ දුකක්. අපට, ජනතාවට සතුට, දැනුම විනෝදය ලබා දෙන්න මේ අය විඳින දුකක්. කරන කැපවීමක්. මොනතරම් ගෞරවනීය ලෙස කලහැකි ස්වෙච්ඡා සේවාවක්ද මේ කෙලෙසිලා තියෙන්නේ.

ඉන්න මිනිස්සු තේරුම් ගන්න ඕනේ පචවෙලා එලවනකම් ඉන්නෙ නැතුව යන්න. පොදු දෙයක් අතලොස්සකගෙ මතවාදය පමණක් ඉස්සරහට ගෙනයන්න අසන්නන්ට එපා වෙන තරමට පාවිච්චි කරන එක හරිද?

අනෙක් අතින් එන්න හදන මිනිස්සු තේරුම් ගන්න ඕනේ තමන්ට මේක කොයිතරම් සාර්ථකව කල හැකි දෙයක්ද කියලා.

ශ්‍රී ලාංකික මෙල්බන් සමාජයට විසල් සේවාවක් කලහැකි රේඩියෝව බෙදා ගැනීමට කල්ලි ගැසී සිටින කණ්ඩායම් දෙකේම හැකියා ඇති අය ගැන දුකයි. මහත්වරුනි ජනතාවට සේවය කරන්න ඇන කොට ගන්න එපා.

## මහින්දගේ ගැහිල්ල

වඩමාරච්චි සංග්‍රාමයෙන් පසු හමුදාව අතපය දිග ඇරල යුද්ධ කරන බව අහන්න, පේන්න තියෙනවා. මුහමාලේ අච්චරයි, සාම්පූර් මෙච්චරයි, මාවිල් ආරු සුද්දයි, කිලාලි ෆ්ලැට්, සෙන්චෝලයක් නැහැ. අපේ අය නම් දැන් යුද්ධය නිසා තෘප්තිමත් වගේ. ඇත්ත ත්‍රස්තවාදය පරාජය කළ යුතුයි. සමාවෙන්න ඒත් මේ කියවෙන ගණන් හිලව් මට නම් මතක් කරන්නේ අපි අර බීබීසී වෙරිටාස් අහපු යුගය. මේ කියවෙන ප්‍රවෘත්තිවල දැඩි ඒක පාර්ෂික ගතියක් දැනෙන්නේ නැද්ද. ඒ දවස්වල කිව්වේත් හමුදාවේ 10 මිය යනකොට කොටි 50 ක් මරුට, 75 ක් ජීවිතක්‍ෂයට, 25 ක් මරු මුවට, 35 මිය ගොස් කියලා. ඒ ගණන් හිලව් හරි නම් මේ වෙනකොට කොටි රටේ නැහැ. ආණ්ඩුව ලොකු යුද්ධයක් කරන බව ඇත්ත. ඒ නිසාම ආණ්ඩුව හරහා ලැබෙන හැම ප්‍රවෘත්තියක්ම නිවැරදි වෙන්නේ නැහැ. ද්‍රවිඩ මාධ්‍ය හරහා ලැබෙන්නේ සාපේක්‍ෂව ප්‍රතිවිරුද්ධ ප්‍රවෘත්තියි. ජනතාව අතිශෝක්තියෙන් තොර සත්‍ය දැන ගත යුතුයි. සත්‍ය කෙතරම් නීරස වූවත් අප දැන ගත යුත්තේ එයයි. කෙසේ වෙතත් ආණ්ඩුව යුද්ධය දේශීය හා ජාත්‍යන්තරව නිවැරදිව කරන බව නම් පේනවා. ලෝක බලවතුන්ගෙන් සුනාමි ණය ආධාර ලැබීමත්, බාහු සහෝදරයාගේ ප්‍රභාකරන් සම්බන්ධ උපමාවත් ඒකට හොඳ උදාහරණයක්.

**සංක්‍රමණිකයා**




# ගී සඳළුව

සිසිර දිසානායක



## මුළු හදින් ...

ගී සඳළුවෙන් අපි කතා වෙන්නේ ගීතයක් නිර්මාණය වෙන්න හේතු භූත වුණ කරුණු කාරණා ගැන. ඒත් සමහර වෙලාවට ගීයක් රසිකයින් අතරට ගියාට පසුව පවා ඒ ගීය පසුබිම් කරගෙන වුණ අපූරු සිද්ධි ගැනත් අපට අහන්න ලැබෙනවා. අතරින් පතර ඒ වගේ දෙයක් ගැනත් ලියන්න හිතුවේ ඒ දේවල්වල තියෙන රසවත්කම, අපූර්වත්වය නිසාමයි.
පසුගියදාක මෙල්බර්න් නුවර පැවැත්වුණ ප්‍රසංගයේදී අසන්නට ලැබුණ කතාවක් ගී සඳලුව කියවන කාටත් දැනගන්නට ලියා තියන්නට " සන්නස" හිතුවා. ඒත් මේ සිද්ධිය නම් රසවත් දෙයක් නෙවෙයි. ඒත් අපූරුයි!

"මුළු හදින් මම" කියන ගීතයේ ගායන ශිල්පියායි නාරද දිසාසේකරයන්. බොහෝම හැඟීම් බරව හරබර ගායනාවක් තමන්ගේ ගැඹුරු, කෝමළ හඬින් ගායනා කරමින් නාරදයන් ගායනයට අවතීර්ණ වුණේ අද ඊයේක නෙවෙයි හැටේ දශකයේදී. විශේෂයෙන්ම පණ්ඩිත් අමරදේවයන් වැනි ඉහළම ගණයේ විශාරදයින්ගේ ගී තනු අගේට ගායනා කරමින් රසිකයින්ගේ ගෞරවාදරයට පත්වුණ නාරදයන් කලින් ගී ප්‍රසංගයේදී කී කතාවකුයි මේ. "මුලු හදින් මම" වියෝ ගීතය සම්බන්ධවයි කතාව.

"මම ඉගෙන ගත්තේ කළුතර මහා විද්‍යාලයේ. විද්‍යාලයේ තිබුණ උත්සවයකට අපි දවසක් සහභාගි වුණා ආදි ශිෂ්‍යයින් හැටියට. පරණ යාලු මිත්‍රයෝ එක්ක අල්ලාප සල්ලාපයේ ඉන්න වෙලාවක එතෙන්ට ආවා අපි වැඩිය දන්නෙ හඳුනන්නෙ නැති පුද්ගලයෙක්." ඒ ආවෙ අපිත් එක්ක එතන හිටපු මිත්‍රයෙකුත් එක්ක. ඒ ඇඳුනුම්කමට. "මුළු හදින් මම" සින්දුව ගයන්න කියලා මේ පුද්ගලයා මට බල කරලම ඉල්ලා හිටියා. අපි අතරේ හිටියා මර්වින් පෙරේරාත් ඔය වෙලාවෙ. මර්විනුත් ඉගෙන ගත්තේ කළුතර විද්‍යාලයේමයි." නාරද "මර්වින්" නමින් හැඳින්වූයේ ළයාන්විත ගී රැසක්ම නිර්මාණය කළ, ගායනා කළ මර්වින් පෙරේරා සංගීතවේදියාවයි.
"අර හාදයාගෙ ඇවටිල්ල නිසාම මර්වින් මට කිව්වා " ඔන්න ඕක කියලා දාපං, අගය නොකර" කියලා. මමත් ඉතින් වෙලාවෙ හැටියට වටපිට බලලා එහෙම සින්දුව කිව්වා. අනේ ඉතින් අර මනුස්සයා ස්තුති කරලා විතරක් නෙවි, පිනුත් දීලයි ගියේ."

*මුළු හදින් මම ඇයට පෙම් කොට*
*අනාගත පෙම් සිහින දුටුවෙමි*
*මගේ සොඳුරිය වෙනත් කෙනෙකුට*
*අයිති වුණ හැටි බලා දුක්වෙමි*

*නිසංසල තැනකට වෙලා*
*අඬන මගේ ඇස් දෙක බලා*
*කියන්නකො දෙවියනේ මෙහි විත්*
*කොහොම ඉන්නද ඉවසලා*

*මගේ අතගෙන කනට ළංවී*
*අනේ සුදු මගෙ ආදරේ යැයි*
*කියන්නට සිතුනේ ඇයිද සුදු*
*නොසිතුවෙ මට දුක් ලැබේයැයි*

*නිදැල්ලේ තුරුළට වෙලා*
*රහස් එක එක කොඳුරලා*
*සිනාසුන හැටි මතක් වෙනකොට*
*කොහොම ඉන්නද ඉවසලා*

*එදා රෑ ගං ඉවුර අසබඩ*
*සුපුන් සඳ පායන වෙලාවක*
*කතා කී හැටි මතක් වෙනකොට*
*දුක දැනෙයි පවතින අපායක*

*මෙහෙම ලෝකෙක ඉපදිලා*
*සිතෙහි අදහස් සුන්වෙලා*
*මා උපන්නේ දුක් විඳින්නද?*
*දුක් අඳුරු මැද තනිවෙලා......*

"මෙන්න පහුවදා අර නන්නාඳුණන පුද්ගලයා කැන්දන් ආව අපේ මිත්‍රයාගෙන් ටෙලිෆොන් කෝල් එකක්! මොකක්ද දන්නවද පණිවිඩය? අර මනුස්සයා එදා රෑම එල්ලියා මැරිලා...!"
ගීයේ ආරම්භක සංගීත ඛණ්ඩ වාදනය වෙන්නට පටන් ගත්තා. දිසාසේකරයන් "මුළු හදින් මම" ගීතය ගයමින් සමාධි ගත වුණා.

එවන් ශෝචනීය ඛේදාන්තයකට යොමු කරන්නට තරම් මේ ගීතයේ ඇති ගුණයයි අපූර්වත්වය. විරහ වේදනාවෙන් තැළුණ සිතක් ගිනි වැද්දීමට තරම් හැඟීම් බර බවක් ගායන ශිල්පියාගේ හඬේත් ගායන විලාශයේත් ගැබ් වෙලා තියෙන එකයි මුල්ම හේතුව. ඒකට උර දෙන්නේ ගීතය ගායනා වෙන තනුවත්, තනුව අලංකාර කරන සංගීතයත් නෙවෙයිද? මේ හැම දෙයක්ම ගොඩ නැංවිලා තියෙන්නේ වචන පෙළ අනුව නෙවෙයිද? කාටත් තේරුම් ගන්නට පුළුවන් විදිහේ සරළ වචන පෙළක අර තරම් ඛේදවාචකයකට යොමු කරවන හැඟීම් කැටි වුණේ කොහොමද කියලා හිතලා බලන්න වටිනවා නේද? එක් අයෙකුගේ අත්දැකීමක් පොදු අත්දැකීමක් විදියට නිර්මාණය වුණාට පස්සේ, ඒ අත්දැකීමම තවත් කෙනෙකුට ඊටත් වඩා දරුණු විදියට දැනුන එකය පුදුමය.

ගීය ලියපු අයගේ අත්දැකීම සංගීතයෙන් තනුවෙන් තීව්‍ර වෙලා. ඒ සියලුම දේ ගායනයෙන් හඬින් තව තවත් දෙගුණ තෙගුණ වෙලා. ඒක නෙවෙයිද හේතුව? ගීය ලියුවේත් තනුව නිර්මාණය කළේත් ගීත රසිකයින්ට වැඩිය හුරු නැති දෙපළක්. නම හුරු නැති වුණත් රසිකයින් සමස්ථ නිර්මාණය වැළඳ ගන්නේ ඒ ගීයේ ඇති සාර්ථක බව නිසා නෙවෙයිද? ගීතය ලිව්වේ එඩ්මන් ජයසූරිය. තනුව හදලා සංගීතවත් කළේ කුලරත්න තෙන්නකෝන්. කුලරත්නයන්ගේ නම හුරු නැති වුණත් නාරදයන්ගේ හඬින් ගැයුණ කරුණාරත්න අබේසේකර ප්‍රබන්ධය කළ "චන්දන ඇඟ ගාලා" ගීය කාටත් හුරුය. කාලයෙන් කාලයට නොයෙක් මාදිලියේ නිර්මාණ බිහිවුණත් අමතක වෙලා යන්න නොදී සිහිපත් කරන්නට වටිනා නාරද දිසාසේකරයන් ගැයූ ගීත කීපයක් පෙළ ගන්වමින් ගී සඳළුව මෙවර නිමා වෙනවා. මහගම සේකරයන් ලියා පණ්ඩිත් අමරදේවයන් සංගීතවත් කළ "ඈත ගව් ගණන් දුරින්" ධර්මසිරි ගමගේ ශූරීන්ගේ පද රචනයකට ප්‍රේමසිරි කේමදාසයින් අතින් සංගීතවත්ව "මනමාලයෝ" චිත්‍රපටය සඳහා ගැයූ "ආදර නිල් දෑසේ", කරුණාරත්න අබේසේකරයන් ලියා, නාරදයන් සංගීතය මුහුකළ "ලස්සන සැමදේ" (සුජාතා අත්තනායක සමඟ), "මේ භවයේදී" චන්ද්‍ර බිම්බ යුරු", අබේසේකරයන් විසින් ලියැවී පී.එල්.ඒ. සෝමපාලයන් තනු නිර්මාණය කළ "නා මලින් දිනූ ලියක්" (සුජාතා අත්තනායක සමඟ), ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් අතින් ලියැවී පණ්ඩිත් අමරදේවයන් නාද ගැන්වූ " පිපී පිපී" සහ විශාරද නන්දා මාලනිය සමඟ ගැයූ "ගලන ගඟකි" , "රන් මුතු දූව" චිත්‍රපටය සඳහා ගැයූ ගී ද්විත්වය.